# 1

# විදේශ ආධාර පිළිබඳ සමස්ථ විග්‍රහය

## 1.1. දස අවුරුදු සංවර්ධන සැළැස්ම හා විදේශීය සංවර්ධන ආධාර

මහින්ද චින්තන - නව ශ්‍රී ලංකාවක් කරා ඉදිරි දැක්ම යන සංකල්පය දියත් කිරීමත් සමඟ මැදි ආදායම් ලබන පිබිදී එන රටක් වශයෙන් ශ්‍රී ලංකාව ආර්ථික ව්‍යාප්තිය පිළිබඳ නව යුගයකට ප්‍රවේශ වී ඇත. 1985 2004 දශවර්ෂ දෙකක කාල පරාසය තුළ ආර්ථික වර්ධනය සියයට 4.4ක සාමාන්‍ය වර්ධනයක සිට සියයට 7ක ප්‍රමාණයක් දක්වා දැනටමත් ලඟා වී ඇති අතර 2008 - 2011 කාල පරාසය තුළ නව ජීවයක් සහිත රටේ වර්ධන වේගය සියයට 8 දක්වාත් ඉන් ඉදිරියට සියයට 10 දක්වාත් වේගවත් කිරීමට මධ්‍ය කාලීන සංවර්ධන වැඩසටහන තුලින් ඉලක්ක කර ඇත. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම අරබයා, තිල වශයෙන් මෙන්ම පෞද්ගලිකව විදේශ ප්‍රාග්ධන ප්‍රවාහයන් අනුසාරයෙන් මෙරටට ලැබෙන විදේශ සම්පත්, දේශීය ආයෝජන පරිපූර්ණ කිරීමට මෙන්ම සමස්ත ආයෝජන ප්‍රමාණය / දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය ඉදිරි දස වසර තුළ සියයට 35-38ක පමණ හිතකර මට්ටමකට ගෙන ඒමෙහිලා සුවිශේෂ කාර්යභාරයක් උසුලයි. මෙම ප්‍රයත්නයෙහිලා විදේශාධාර විදේශ සම්පත් සම්භාරයේ ප්‍රධාන සංරචකය වශයෙන් කටයුතු කරයි.

2006 වසරේදී ලැබූ මුළු විදේශ ආධාර, රාජ්‍ය ආයෝජන සඳහා සියයට 60 ක ප්‍රමාණයකින් දායකත්වයක් ලබාදීමට සමත් වී ඇත. මෙම විදේශ ආධාර ආපසු නොගෙවිය යුතු ප්‍රදාන වශයෙන් ද, අඩු පොලියට ආපසු ගෙවීමේ දීර්ඝ කාලීන කාල පරාස සහිත සැහැල්ලු කොන්දේසි මත දෙන්නාවූ සහනදායී ණය වශයෙන් ශ්‍රී ලංකාවට ලැබෙනු ඇත. ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන රටක් වශයෙන් රාජ්‍ය මූල්‍ය වගකීම් පනත ප්‍රකාර විමර්ෂණ සීමාවන්ට යටත්ව, වාණිජමය වශයෙන් යෝග්‍යවන ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා සහනදායී නොවන ණයද, ලබා දී ඇත. දේශිය මෙන්ම විදේශ සම්පත් පරිපූර්ණ කිරීම අරභයා වාණිජමය වශයෙන් යෝග්‍යවන ව්‍යාපෘති මූල්‍යනය සඳහා සහනදායී නොවන ණය සීමිත වශයෙන් ලබා ගෙන ඇත. එසේ වුවද මධ්‍යම ආදායම් ලබන රටක් කරා ශ්‍රී ලංකාව ප්‍රවේශවීම තුළින්, සහනදායී ණය ලබා ගැනීමට ඇති අවස්ථාවන්හි ක්‍රමානුකූල අඩු වීමක් පෙන්නුම් කෙරෙන බැවින් අනිකුත් අරමුදල් ප්‍රභවයන් ඵලදායී ලෙස උපයෝගී කර ගැනීමට උත්සුක විය යුතුය. මේ සම්බන්ධයෙන් සුවිශේෂීව වාණිජමය වශයෙන් යෝග්‍ය වන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම උදෙසා අපනයන ණය පහසුකම් හා ජාත්‍යන්තර ප්‍රාග් ධන වෙළඳපොලෙන් ගනු ලබන ණය ද එකී වාණිජමය මූල්‍ය ප්‍රභවයන් තුළට ගැනේ.

2007 ජනවාරි සිට සැප්තැම්බර් අග දක්වා ගිවිසුම අත්සන් කිරීම තුළින් ප්‍රදායකයන් විසින් ශ්‍රී ලංකාව වෙත ලබා දීමට එකඟතාවය පළ කර ඇති ණය / ප්‍රදාන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 949කි. එකඟතාවය පළ කර ඇති මුළු ප්‍රමාණයෙන් ඇ.ඩො. 852ක් ණය වශයෙන් ද ඇ.ඩො. 97ක් ප්‍රධාන වශයෙන් ලබා දෙනු ඇත. ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් හා දිළිඳුකම අවම කිරීමේ විශාලතම සංවර්ධන පාර්ශවකරු වශයෙන් පෙරමුණේ සිටින ජපන් රජය ස්වකීය තත්ත්වය පවත්වා ගනිමින් 2007 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාල පරාසය තුළ ඇ.ඩො. මිලියන 370.73ක් ලබා දීමට එකඟතාවය පළ කරන ලදී. එයින් ඇ.ඩො. මිලියන 334.12ක් ණය වශයෙන් ද ඇ.ඩො. මිලියන 36.61ක් ප්‍රදාන වශයෙන් ද ලබා දෙනු ඇත.

ආසියානු සංවර්ධන බැංකුව ඇ.ඩො. මිලියන 313.50 ක මුළු මුදල් ප්‍රමාණයක් ලබා දීමට එකඟතාවය පළකර ඇති අතර, එයින් ඇ.ඩො. මිලියන 300ක් කොළඹ දකුණ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වේ. රට අමතරව අධ්‍යාපන අංශය හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇ.ඩො. මිලියන 130 ක් ලබා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කොට සම්මුතියකට එළඹෙන ලදී. දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය උදෙසා ඇ.ඩො. මිලියන 90 ක අතිරේක ණයක් ලබා ගැනීමට 2007 නොවැම්බර්හි දී සම්මුති සාකච්ඡා පැවැත්වීමට අදහස් කෙරේ. රටේ යටිතල පහසුකම් සංවර්ධනයෙහිලා චීන රජය ද, ප්‍රමුඛ පෙළේ සංවර්ධන පාර්ශවකරුවකුගේ තත්වයට පත් වී ඇත. ඇ.ඩො. මිලියන 72.19 ක මුදලක් ලබා දීමට චීන රජය එකඟතාවය පළකර ඇති අතර එකී මුදල් සහනදායී ණය වශයෙන් ලබා දෙනු ඇත. හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ I අදියර සඳහා රජය වෙතින් දශ ලක්ෂ මිලියන 307 ක් ලබා දීම සඳහා වන ගිවිසුම 2007 ඔක්තොම්බර් 30 වන දින අත්සන් කරන ලදී. මෙම කාල පරාසය තුළ ලෝක බැංකුව වෙතින් ද පුත්තලම දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් හා නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් උදෙසා ඇ.ඩො. මිලියන 32.87 ක ණය ප්‍රමාණයක් ලබා දී ඇත. මීට අමතරව, ප්‍රතිජනනය කළ හැකි බලශක්ති ප්‍රවර්ධනය, නීති හා අධිකරණ ප්‍රතිසංස්කරණ සංවර්ධනය, ජල වේලි ප්‍රතිසංස්කරණය හා ජල සම්පත් කළමනාකරණය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා වටිනාකම ඇ. ඩො. මිලියන 200 ක් පමණ වන මූල්‍යයන ගිවිසුම් හතරක් සඳහා සම්මුති සාකච්ඡා කෙරෙමින් පවතී.

දුම්රිය හා මාර්ග අංශය සඳහා ආධාර ලබාදීමට ඉන්දියානු සහ කොරියන් රජයන් එකඟ වී ඇත. ඉන්දියානු රජයෙන් ලබා දෙන ඇ.ඩො. මිලියන 100 කට අධික ආධාර ඇතිව මාතර-කොළඹ දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමට ද කොරියානු රජයෙන් ලැබෙන ආධාර උපයෝගී කොට ඇ.ඩො. මිලියන 44ක් වැය වෙතැයි ඇස්තමේන්තු ගත කර ඇති අනුරාධපුර-පාදෙනිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමට ද අපේක්ෂා කෙරේ.

ප්‍රදාන ණය සහ ව්‍යාපෘති වෙනුවෙන් 2007 සැප්තැම්බර් 30 දින වන විට උපයෝජනය කර ඇති මුළු විදේශාධාර ප්‍රමාණය ඇ.ඩො. මිලියන 717 ක් වන අතර 2007 වර්ෂය ආරම්භයේ දී පුරෝකථනය කරන ලද ඇ.ඩො. මිලියන 1,200 ප්‍රමාණයෙන් සියයට 59.8 කි. සමස්ථ වැය යෝජන ප්‍රමාණයෙන් ව්‍යාපෘති ණය සඳහා ඇ.ඩො. මිලියන 544 (සියයට 75.8) ක් ද ප්‍රදාන වශයෙන් ඇ.ඩො. මිලියන 173 (සියයට 24.2) ක් ද ලබා දී ඇත.

## 1.2. විදේශ ආධාර එකඟතාවයන් හා උපයෝජනයන්

2007 වසර මුල් මාස 09 තුල ප්‍රදායකයන් විසින් ශ්‍රී ලංකාවට ලබාදීමට එකඟ වූ විදේශ ණය හා ප්‍රදාන ප්‍රමාණය ඇ.ඩො.මිලියන 949 කි. මින් ඇ.ඩො.මිලියන 852 ක් ව්‍යාපෘති ණය වශයෙන් හා ඇ.ඩො.මිලියන 97 ක් ප්‍රදානයන් වශයෙන් ලබා දීමට එකඟතාවය පළකර ගිවිසුම් වලට එළඹී ඇත.

අංශමය වශයෙන් සහ ප්‍රදායකයන් අනුව වර්ගීකරණය කරන ලද එකඟවූ විදේශ ආධාර ප්‍රමාණය පිළිවෙලින් වගුව 01 හා වගුව 02 හි දැක්වේ.

වගුව 01 2007 වසරේදී එකඟත්වය පළකරන ලද මුළු ආධාර ප්‍රමාණය අංශමය වශයෙන් (2007 සැප්. 30 දක්වා.)

### වගුව 1 - 2007 වසරේ එකඟතාවය පලකරන ලද මුළු ආධාර ප්‍රමාණය

| අංශය | ඇ.ඩො.මිලියන | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| ප්‍රවාහන හා මහාමාර්ග | 252.4 | 15.3 | 267.7 |
| වරාය සහ ගුවන් සේවා | 300.0 | 0.0 | 300.0 |
| ජල සම්පාදනය සහ සනීපාරක්ෂණය | 146.1 | 0.0 | 146.1 |
| සුනාමි පුනරුත්ථාපනය | 30.5 | 10.2 | 40.7 |
| සෞඛ්‍ය, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු | 17.6 | 11.8 | 29.4 |
| කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, වැවිලි හා ධීවර | 23.1 | 5.0 | 28.0 |
| පුනරුත්ථාපන | 32.9 | 9.2 | 42.1 |
| ග්‍රාමීය සංවර්ධන | 34.8 | | 34.8 |
| පරිසරය හා ස්භාවික සම්පත් | 4.0 | 0.1 | 4.1 |
| තොරතුරු තාක්ෂණය, විද්‍යා හා තාක්ෂණ ආයතනික සංවර්ධනය | 2.0 | 8.3 | 10.3 |
| නිවාස හා නාගරික සංවර්ධනය | 8.9 | | 8.9 |
| වෙනත් | | 37.6 | 37.6 |
| වෙළඳපොළ ණය | 210.0 | 0.0 | 210.0 |
| එකතුව | 1,062.2 | 97.5 | 1,159.7 |

## ප්‍රස්තාර 1 – 2007 වසරේදී එකඟතාවය පළ කරන ලද මුළු ආධාර ප්‍රමාණය අංශමය වශයෙන්




ජපන් රජය සහ චීන රජය ඇ.ඩො. මිලියන 268 ක මුදලක් මහාමාර්ග ප්‍රවාහන අංශය සඳහා ලබා දීමට එකඟතාවය පලකර ඇත. ජපන් රජයේ ආධාර මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (ඇ.ඩො. මිලියන 187) සහ මන්නාරම පාලම සහ නැවිල්ල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (ඇ.ඩො. මිලියන 15) සඳහා වේ. චීන රජය එකඟතාවය පළකර ඇති ඇ.ඩො. මිලියන 66 ක මුදල මගී දුම්රිය මැදිරි 100 ක් ආනයනය කිරීමට හා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා බලවේග කට්ටල 15 ක් මිලදී ගැනීම සඳහා යෙදවේ. මීට අමතරව ජපාන රජය ජල අංශීය සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇ.ඩො. මිලියන 113 ක් සහ දිළිඳු හිතකාමී ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 35 ක්ද ලබාදීමට එකගවී ඇත. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ඇ.ඩො. මිලියන 300 ක මුදලක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාවය පලකර ඇත. 2007 සැප්තැම්බර් 30 දක්වා අත්සන් තබන ලද විදේශ ආධාර ගිවිසුම් පිළිබඳ විස්තර ඇමුණුම 01 හි දක්වා ඇත.

වගුව 2 - 2007 සැප්තැම්බර් 30 දින වන විට එකඟතාවය පළකරන ලද ණය ප්‍රමාණය ප්‍රදායකයා අනුව

| ප්‍රදායකයා | ඇ.ඩො.මිලියන | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| ජපානය | 334.12 | 36.85 | 370.97 |
| චීනය | 65.76 | 13.63 | 79.39 |
| ජර්මනිය | 0.00 | 17.32 | 17.32 |
| කොරියාව | 16.04 | 0.00 | 16.04 |
| අනෙකුත් ද්විපාර්ශවික | 52.25 | 14.13 | 49.36 |
| අපනයන ණය | 12.70 | 0.00 | 29.72 |
| ආසියානු සංවර්ධන බැංකුව | 313.50 | 0.00 | 313.50 |
| ලෝක බැංකුව | 32.87 | 0.00 | 32.87 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 23.09 | 15.61 | 38.70 |
| අනෙකුත් බහුපාර්ශවික | 1.88 | 0.00 | 1.88 |
| **මුළු එකතුව** | **852.21** | **97.54** | **949.75** |
| වාණිජ බැංකු | 210.00 | 0.00 | 210.00 |
| **එකතුව** | **1,062.21** | **97.54** | **1,159.75** |

සංවර්ධන සහකරුවන් අතුරෙන් 2007 වසරේ වැඩිම ආධාර එකඟතාවය පලකර ඇති ප්‍රදායකයන් තිදෙනා වනුයේ පිළිවෙලින් ජපාන රජය, ආසියානු සංවර්ධන බැංකුව සහ චීන රජයයි. මෙම ප්‍රදායකයන් තිදෙනා එකඟතාවය පලකර ඇති මුළු ආධාර ප්‍රමාණය ඇ.ඩො.මිලියන 764 ක් වෙ. එය මෙම වසර සඳහා ප්‍රදායකයන් විසින් ලබාදීමට එකඟ වී ඇති මුළු ආධාර ප්‍රමාණයෙන් සියයට 80.4 කි.

## වැයයෝජනය සඳහා ඉතිරිව ඇති එකඟ වූ ආධාර

2007 සැප්තැම්බර් 30 දින වන විට රජයේ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා වැයයෝජනය කිරීමට ඉතිරිව ඇති එකඟ වූ විදේශ ආධාර ප්‍රමාණය ඇ.ඩො. බිලියන 4.56 ක් පමණ වෙ. වැයයෝජනය සඳහා ඉතිරිව ඇති මෙම ප්‍රමාණය වසර 02 සිට 05 දක්වා කාල පරිච්ඡේදයක් තුළ වැයයෝජනය කළ හැකි වෙ. වගුව 03 සහ 04 පිළිවෙළින් අංශමය සහ ප්‍රදායකයා අනුව වැයයෝජනය සඳහා ඉතිරිව ඇති එකඟ වූ ආධාර ප්‍රමාණයන්හි විස්තර දක්වා ඇත.

## වගුව 3 - 2007 සැප්. 30 දිනට එකඟතාවය පළකර වැයයෝජනය කිරීමට ඉතිරිව ඇති ශේෂය අංශමය වශයෙන්

| අංශය | වටිනාකම ඇ.ඩො.මිලියන | මුළු වටිනාකම ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|
| ප්‍රවාහන මහාමාර්ග වරාය හා ගුවන්සේවා. | 1,274.7 | 27.96 |
| සුනාමි පුනරුත්ථාපනය | 868.3 | 19.05 |
| විදුලි හා බල ශක්ති | 546.1 | 11.98 |
| ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 416.8 | 9.14 |
| සෞඛ්‍ය, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු | 296.2 | 6.50 |
| කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, වැවිලි සහ ධීවර | 243.0 | 5.33 |
| වෙළඳ හා සංචාරක | 28.5 | 0.63 |
| පුනරුත්ථාපන | 158.6 | 3.48 |
| මූල්‍ය කළමනාකරණය | 132.5 | 2.91 |
| ග්‍රාමීය සංවර්ධනය | 99.6 | 2.18 |
| පරිසරය සහ ස්වභාවික සම්පත් | 94.4 | 2.07 |
| තොරතුරු තාක්ෂණය, විද්‍යා හා තාක්ෂණය, ආයතනික සංවර්ධනය | 82.0 | 1.80 |
| නිවාස සහ නාගරික සංවර්ධනය | 64.4 | 1.41 |
| වෙනත් | 254.1 | 5.57 |
| **එකතුව** | 4559.2 | 100.00 |

## වගුව 4 - වැයයෝජනය කිරීමට ඉතිරිව ඇති ශේෂය - ප්‍රදායකයා අනුව

| ප්‍රදායක | වටිනාකම ඇ.ඩො. මිලියන | මුළු වටිනාකම ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 1270.6 | 27.87 |
| ලෝක බැංකුව | 413.2 | 9.06 |
| ජපානය | 1242.2 | 27.25 |
| ප්‍රංශය | 127.2 | 2.79 |
| චීනය | 464.0 | 10.18 |
| ජර්මනිය | 111.7 | 2.45 |
| ඇමරිකා එක්සත් ජනපදය | 62.6 | 1.37 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 137.7 | 3.02 |
| යුරෝපා ආයෝජන බැංකුව | 126.1 | 2.77 |
| අපනයන ණය | 151.4 | 3.32 |
| වෙනත් | 452.5 | 9.92 |
| **එකතුව** | 4559.2 | 100.00 |

## විදේශ ආධාර වැයයෝජනය

2007 වසරේ ඉලක්කගත විදේශ ආධාර වැයයෝජනය ඇ.ඩො.බිලියන 1.2 කි. ඉන් ඇ.ඩො. මිලියන 717 ක ප්‍රමාණයක් 2007 සැප්තැම්බර් 30 දින වන විට වැයයෝජනය කර ඇත. මුළු වැයයෝජනයෙන් ඇ.ඩො.මිලියන 544 ව්‍යාපෘති ණය වශයෙන්ද (සියයට 75.8) ඇශඩො.මිලියන 173 ක් (සියයට 24.2) ප්‍රදාන වශයෙන්ද වියදම කර ඇතශ වැයයෝජනය කරන ලද විදේශ ආධාර එක් එක් ප්‍රදායකයන් අනුව ඇමුණුම් 2 හි දක්වා ඇත. 2007 වසර වල කරන ලද වැයයෝජනයන් සන්සන්දනාත්මකව වගුව 05 හි දැක්වේ.

### වගුව - 5- විදේශාධාර වැයයෝජනය* 2006 - 2007 (සැප්තැම්බර් 30 දක්වා)

*ඇ.ඩො. මිලියන*

| ප්‍රදායකයා | 2007.01.01 -2007.09.30 (මාස 09) | 2006.01.01 - 2007.09.30 (මාස 09) | 2006.01.01 - 2006.12.31 (මාස 12) |
|---|---|---|---|
| චීනය | 149.6 | 6.1 | 9.9 |
| ජර්මනිය | 45.1 | 78.4 | 108.3 |
| ඉන්දියාව | 12.8 | 8.8 | 21.5 |
| ජපානය | 158.6 | 198.8 | 301.2 |
| කොරියාව | 17.8 | 10.9 | 19.8 |
| ස්විඩනය | 11.5 | 2.0 | 11.3 |
| ඇමරිකා එක්සත් ජනපදය | 14.5 | 8.7 | 28.6 |
| ආසියානු සංවර්ධන බැංකුව | 90.5 | 138.0 | 201.6 |
| ලෝක බැංකුව | 107.6 | 108.1 | 166.9 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 27.4 | 67.3 | 90.9 |
| යුරෝපිය ආයෝජන බැංකුව | 6.7 | 0.0 | 33.0 |
| අපනයන ණය | 36.8 | 56.5 | 99.4 |
| වෙනත් | 38.3 | 23.4 | 44.4 |
| **එකතුව** | 717.2 | 707.0 | 1136.8 |

* වාණිජ ණය ඇතුලත් නැත

# ප්‍රස්ථාර 2 - විදේශාධාර වැයයෝජනය 2007




2007 වසරේදී ජපන් රජය, ආසියානු සංවර්ධන බැංකුව ලෝක බැංකුව සහ චීන රජය ඇ.ඩො. මිලියන 506 ක වැයයෝජනයක් කර ඇතග මෙය මුළු වැයයෝජනයෙන් 70.6% ක ප්‍රමාණයකි. ජපානය විසින් කරන ලද මුළු වැයයෝජනය ඇ.ඩො. මිලියන 158.6 ක් වන අතර එය ප්‍රධාන වශයෙන් දකුණු අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය සහ දිළිඳු හිතකාමී ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර ඇත. 2007 වසරේදී ඇ.ඩො.මිලියන 149.6 වැයයෝජනය කරමින් චීනය සංවර්ධන හවුල්කරුවන් අතර දෙවැනි ස්ථානයට පත්ව සිටී. චීන රජය වැයකර ඇති මුළු මුදලින් ඇ.ඩො.මිලියන 136.5 ක්ම වැයකර ඇත්තේ පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය සඳහා වේ. ලෝක බැංකුව විසින් වැයයෝජනය කරන ලද මුදල් ප්‍රමාණය වූ ඇ.ඩො.මිලියන 107.6 ප්‍රධාන වශයෙන්ම මාර්ග අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය, ග්‍රාමීය සංවර්ධනය සඳහා නැවත උත්පාදනය කළ හැකි බලශක්ති යෙදවීම පිළිබඳ ව්‍යාපෘතිය හා .ගැමි දිරිය. ව්‍යාපෘතිය යන ඒවා සඳහා යොදවා ඇත. ආසියානු සංවර්ධන බැංකුව මාර්ග පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, විදුලිබල අංශය සංවර්ධන ව්‍යාපෘතිය සහ සුනාමියෙන් විපතට පත් ප්‍රදේශ නැවත ගොඩනැංවීමේ ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති සඳහා ඇ.ඩො. මිලියන 90.5 ක් වැයයෝජනය කර ඇත. ඇ.ඩො. මිලියන 10 කට වැඩි වැයයෝජනයක් වාර්තා කල ව්‍යාපෘති පිළිබඳව වගුව 6 හි දක්වා ඇත.

වගුව 6 - 2007 වසර තුළ ඇ.ඩො. මිලියන 10 ට වැඩියෙන් වැය යෝජනය කළ ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ප්‍රදායකයා | ඇ.ඩො.මිලියන |
|---|---|---|
| ඉන්දියානු ණය මාලාව | ඉන්දියා | 10.42 |
| දකුණු අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ජපානය | 21.06 |
| ඉහළ කොත්මලේ විදුලිබල ව්‍යාපෘතිය | ජපානය | 10.91 |
| කුඩා හා සුක්ෂම කාර්මාන්ත කරුවන්ගේ දායකත්ව හා ව්‍යවසායකයින් නංවාලීමේ ව්‍යාපෘතිය | ජපානය | 16.38 |
| ශ්‍රී ලංකාවේ සුනාමි ව්‍යවසායෙන් විනාශයට පත්වූ ප්‍රදේශ යථා තත්වයට පත්කිරීමේ හා නංවාලීමේ (START) ව්‍යාපෘතිය | ජපානය | 12.14 |
| දිළිදු හිතකාමී ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | ජපානය | 13.32 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | චීනය | 136.5 |
| මාර්ග අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය | ආසි.සං.බැ. | 12.63 |
| දකුණු අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ආසි.සං.බැ. | 13.12 |
| විදුලිබල අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය | ආසි.සං.බැ. | 10.13 |
| මාර්ග අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය | ලෝක බැංකුව | 18.68 |
| ගැමි දිරිය ව්‍යාපෘතිය | ලෝක බැංකුව | 14.12 |

## 1. 3 විදේශ ණය ප්‍රමාණය

2007 සැප්තැම්බර් 30 දිනට රජයේ සමස්ථ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො.බිලියන 11.28 කි. ඉන් 45% ක් ද්විපාර්ශවික ප්‍රදායකයින් වෙත ගෙවිය යුතු වූ අතර, 46% ක් බහුපාර්ශවික ප්‍රදායකයින්ටද, 5.4% ක් වාණිජ බැංකු වෙතද ඉතිරි 3.6% අපනයන ණය ආයතන වලටද ගෙවිය යුතුය. 2007 සැප්තැම්බර් 30 දිනට පැවති විදේශ ණය ප්‍රමාණයේ සංයුතිය ප්‍රධාන ප්‍රදායකයන් අනුව ප්‍රස්ථාර 3 හි දක්වා ඇත.

## ප්‍රස්ථාර 3 - විදේශ ණය ප්‍රමාණයේ සංයුතිය




## විදේශ ණය සේවා ගෙවීම්

2007 වසරේ මුල් මාස නවය සඳහා වූ ණය සේවා ගෙවීම් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 604 කි. මින් ඇ.ඩො. මිලියන 460 ක් ණය වාරික ආපසු ගෙවීම් සඳහා වූ අතර ඇ.ඩො. මිලියන 144 ක් ණය පොලී ගෙවීම් සඳහා විය. 2007 වසරේ ඇස්තමේන්තු ගත සමස්ථ ණය සේවා ගෙවීම් ඇ.ඩො.මිලියන 813 ක් වේ. පවත්නා ණය ප්‍රමාණය පදනම් කරගෙන සමස්ථ ණය සේවා ගෙවීම් වල විස්තර වගුව 7 න් දැක්වේ.

## රජය විසින් ඇ.ඩො.මිලියන 500ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව

ශ්‍රී ලංකාව පිබිදී එන මධ්‍යම ආදායම් ලබන රටක් වශයෙන් පැන නැගෙන අවශ්‍යතාවයන් මත දේශීය සම්පත් සහ වෙනත් විදේශීය සම්පත් වලට අමතරව යටිතල පහසුකම් සඳහා වන ආයෝජන මට්ටම ඉහළ දැමීම සඳහා බැඳුම්කර

නිකුතුව මගින් රටෙහි ආයෝජන පදනම පුළුල් කරගනිමින් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපළට සාර්ථකව ඇතුළත් වී ඇත.

ජාත්‍යන්තර වෙළඳපොළෙහි බැඳුම්කර විකිණීම මගින් 2007 ඔක්තෝම්බර් 17 වන දින රජය ඇ.ඩො. මිලියන 500 ක් ඒකරාශී කරගෙන ඇත. බැඳුම්කර මගින් ලැබුණු අරමුදල්, විදුලි බල උත්පාදනය, පානීය ජලය සැපයීම, මාර්ග, වරාය පහසුකම් සහ දුම්රිය මාර්ග වැනි යටිතල පහසුකම් සඳහා ලැබී ඇති සහන අරමුදල් වලට අනුපූරකව යොදා ගනු ලැබේ. බැඳුම්කර නිකුතුවේදී බාර්ක්ලේස් කැපිටල්, එච් එස් බී සී සහ ජේ.පී. මෝගන් ඒකාබද්ධ ප්‍රධාන කළමණාකරුවන් ලෙස සහ ලංකා බැංකුව සම කළමණාකරු වශයෙන් කටයුතු කරන ලදී.

සිංගප්පූරුව, හොංකොං, ලන්ඩන්, නිව්යෝර්ක්, ලොස් ඇන්ජලීස් සහ බොස්ටන් යන රටවල පැවැත්වුණු රූස්වීම් වලින් පසුව ඇණවුම් ප්‍රමාණය සඳහා තුන් ගුණයකටත් වඩා අධික දායකත්වයක් විය. රජය විසින් කරන ලද ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව ජාත්‍යන්තර ආයෝජන ප්‍රජාව අතර මිළ නියම කිරීමෙන් හා බැඳුම්කර වෙන් කිරීම සමගින් සාර්ථකව අවසන් කරන ලදී.

මෙම බැඳුම්කර සියයට 8.25 කූපනයක් ද සමඟ 2012.10.24 වන දිනට කල් පිරෙන පරිදි බැඳුම්කර නිකුත් කරන ලදී.

මෙම ගනුදෙනුවට ආයෝජකයින් 136 දෙනෙකු සහභාගි වූ අතර, එයින් සියයට 30 ක් ආසියාවේ ද, සියයට 30 ක් යුරෝපයේ ද, සියයට 40 ක් ඇමෙරිකා එක්සත් ජනපදයේ ආයෝජකයන් වූහ. මෙම ආයෝජකයින් අතරින් සියයට 53 ක් වත්මන් කළමණාකරුවන් වන අතර සියයට 25 ක් බැංකු ද, සියයට 22 ක් රක්ෂණ අරමුදල්, සුළු පරිමාණ බැංකු කටයුතු ඉටු කරන බැංකු යන අනෙකුත් අරමුදල් ද වූහ.

## රුපියල් අගයකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර තුළින් විදේශ සම්පත්

ඉහත සඳහන් වැයයෝජනයන්ට අමතරව විදේශ සහභාගීත්වය සඳහා රුපියල් අගයකින් යුත් වසර 5-11 දක්වා කාල පරාසයන් තුළ කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර තොග සියයට 5 ක් විවෘත කිරීම තුළින් ඇ.ඩො. මිලියන 337 ක් රජය මගින් නිකුත් කරන ලදී.

## වගුව 7 - විදේශ ණය සේවා ගෙවීම් *2006 - 2010

ඇ.ඩො. මිලියන

| වසර / අයිතමය | නිශ්චිත වියදම් | | පුරෝකථනය කල ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|
| | 2006 | 2007 07 සැප්.30 | 2007 | 2008 | 2009 | 2010 |
| මුළු විදේශ ණය ප්‍රමාණය | 10,633.1 | 11,284.0 | 11,115.5 | 11,914.4 | 11,964.0 | 11,934.6 |
| වාර්ෂික ආපසු ගෙවීම් | 422.8 | 460.7 | 619.7 | 734.1 | 740.7 | 547.2 |
| ණය හා පොලී ගෙවීම් | 176.5 | 144.0 | 193.5 | 204.2 | 209.8 | 205.2 |
| **මුළු ණය සේවා ගෙවීම්** | **599.3** | **604.7** | **813.2** | **938.3** | **950.5** | **752.4** |

* වාණිජ ණය සඳහා වන ණය සේවා ගෙවීම්ද ඇතුලත් වේ.

ණය සේවා ගෙවීම් පිළිබඳ විස්තර ප්‍රධාන ප්‍රදායකයන් අනුව වගුව 8 න් දැක්වේ. ජපානය, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව යන ප්‍රධාන ප්‍රදායකයන් තිදෙනා වෙත කරන ලද ණය සේවා ගෙවීම් ප්‍රමාණය 2007 වසරේ කරන ලද මුළු ණය සේවා ගෙවීම් වලින් සියයට 49.5 කි.

## වගුව 8 - විදේශ ණය සේවා ගෙවීම් ප්‍රදායකයා අනුව 2006-2010

ඇ.ඩො.මිලියන

| ප්‍රදායකයා | සත්‍ය වියදම් | | පුරෝකථනය කල ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|
| | 2006 | 2007 (30/09/07) | 2007 | 2008 | 2009 | 2010 |
| **ද්විපාර්ශවික** | **342.7** | **272.3** | **402.5** | **446.6** | **457.2** | **380.0** |
| ජපානය | 215.8 | 185.8 | 254.1 | 272.2 | 272.4 | 221.7 |
| ඇමරිකා එක්සත් ජනපදය | 48.5 | 31.5 | 51.7 | 52.0 | 51.2 | 40.5 |
| ජර්මනිය | 43.2 | 20.7 | 46.9 | 51.6 | 51.0 | 39.5 |
| ප්‍රංශය | 9.0 | 5.9 | 10.8 | 11.8 | 12.1 | 9.7 |
| නෙදර්ලන්තය | 5.8 | 5.3 | 7.1 | 6.5 | 4.4 | 1.7 |
| කැනඩාව | 4.2 | 4.5 | 5.1 | 5.6 | 5.6 | 4.3 |
| කුවේට් | 4.7 | 2.8 | 4.9 | 4.7 | 5.0 | 5.5 |
| කොරියාව | 7.4 | 8.1 | 10.8 | 13.2 | 13.2 | 11.4 |
| ඉන්දියාව | 0.0 | 5.9 | 6.4 | 14.9 | 16.3 | 15.2 |
| චීනය | 2.9 | 1.3 | 3.0 | 10.5 | 18.9 | 21.0 |
| අනෙකුත් ද්විපාර්ශවික | 1.2 | 0.5 | 1.7 | 3.6 | 7.1 | 9.5 |
| **බහුපාර්ශවික** | **146.9** | **119.9** | **162.7** | **203.6** | **240.3** | **263.5** |
| ආසියානු සංවර්ධන බැංකුව | 76.1 | 61.0 | 86.0 | 117.6 | 146.0 | 165.0 |
| ලෝක බැංකුව | 57.9 | 52.4 | 68.0 | 73.3 | 76.0 | 79.0 |
| ජාත්‍යන්තර කෘෂිකර්ම සංවර්ධන අරමුදල | 8.2 | 2 | 2.4 | 3.2 | 3.8 | 3.8 |
| අනෙකුත් බහුපාර්ශවික | 4.7 | 4.5 | 6.3 | 9.5 | 14.5 | 15.7 |
| **වාණිජ ණය** | **76.0** | **188.0** | **209.8** | **242.1** | **203.6** | **49.6** |
| **අපනයන ණය** | **33.7** | **24.5** | **38.2** | **46.0** | **49.4** | **59.3** |
| **එකතුව** | **599.3** | **604.7** | **813.2** | **938.3** | **950.5** | **752.4** |
| **විනිමය අනුපාතය ඇ.ඩො./රු.** | 107.7 | 113.5 | 113.5 | | | |

2002 සිට 2007 දක්වා විදේශාධාර වල ශුද්ධ ප්‍රවාහය වගුව 9 න් දැක්වේ.

## වගුව 9 - 2002 සිට 2007 දක්වා විදේශාධාර වල ශුද්ධ ප්‍රවාහය

| ප්‍රදායක ආයතනය | විස්තර | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007.09.30 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **බහුපාර්ශවික** | | | | | | | |
| ආ.සං.බැං. | වැයයෝජනය | 153.5 | 217.9 | 187.0 | 216.8 | 201.6 | 90.5 |
| | පොලී ගෙවීම් | 14.8 | 17.8 | 20.2 | 24.0 | 28.2 | 22.8 |
| | වාරික ගෙවීම් | 23.4 | 30.8 | 32.0 | 40.9 | 47.9 | 38.2 |
| | ශුද්ධ ප්‍රවාහය | 115.3 | 169.3 | 134.8 | 151.9 | 125.5 | 29.5 |
| ලෝක බැංකුව | වැයයෝජනය | 94.3 | 210.1 | 72.1 | 156.7 | 166.9 | 107.6 |
| | පොලී ගෙවීම් | 12.5 | 13.8 | 15.3 | 16.1 | 15.7 | 15.5 |
| | වාරික ගෙවීම් | 33.8 | 37.9 | 38.4 | 39.6 | 42.2 | 36.9 |
| | ශුද්ධ ප්‍රවාහය | 48.0 | 158.4 | 18.4 | 1010.0 | 109 | 55.2 |
| ජා.මූල්‍ය අරමුදල | වැයයෝජනය | 123.5 | 82.1 | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| | පොලී ගෙවීම් | 2.1 | 0.0 | 5.7 | 0.0 | 0.0 | 0.0 |
| | වාරික ගෙවීම් | 50.2 | 23.2 | 107.8 | 0.0 | 0.0 | 0.0 |
| | ශුද්ධ ප්‍රවාහය | 71.2 | 58.9 | -113.5 | 0.0 | 0.0 | 0.0 |
| **ද්වීපාර්ශවික** | | | | | | | |
| ජපානය | වැයයෝජනය | 183.1 | 250.8 | 276.5 | 235.0 | 301.2 | 158.6 |
| | පොලී ගෙවීම් | 53.8 | 60.6 | 65.7 | 6.6 | 57.4 | 48.1 |
| | වාරික ගෙවීම් | 94.1 | 108.8 | 126.3 | 10.2 | 158.4 | 137.7 |
| | ශුද්ධ ප්‍රවාහය | 35.2 | 81.4 | 84.5 | 218.2 | 85.4 | -27.2 |
| ඇ.එ.ජ. | වැයයෝජනය | 2.0 | 11.0 | 8.0 | 17.0 | 28.6 | 14.5 |
| | පොලී ගෙවීම් | 18.3 | 17.9 | 17.3 | 3.7 | 16.7 | 10.0 |
| | වාරික ගෙවීම් | 24.9 | 25.9 | 26.1 | 5.2 | 31.8 | 21.4 |
| | ශුද්ධ ප්‍රවාහය | -40.8 | -32.7 | -35.8 | 7.8 | -19.9 | -16.9 |
| ජර්මනිය | වැයයෝජනය | 15.2 | 26.6 | 39.7 | 64 | 108.3 | 45.1 |
| | පොලී ගෙවීම් | 6.0 | 7.2 | 8.0 | 5.4 | 10.6 | 5.2 |
| | වාරික ගෙවීම් | 12.9 | 14.8 | 14.8 | 10.4 | 32.6 | 15.5 |
| | ශුද්ධ ප්‍රවාහය | -3.7 | 4.6 | 16.9 | 48.2 | 65.1 | 24.4 |
| අනෙකුත් | වැයයෝජනය | 131.3 | 308.1 | 200.9 | 528.0 | 580.2 | 510.9 |
| | පොලී ගෙවීම් | 12.6 | 14.1 | 18.7 | 19.9 | 47.8 | 42.4 |
| | වාරික ගෙවීම් | 44.8 | 43.6 | 50.3 | 66.5 | 109.9 | 211.1 |
| | ශුද්ධ ප්‍රවාහය | 73.9 | 250.4 | 131.9 | 441.6 | 422.5 | 257.4 |
| **එකතුව** | වැයයෝජනය | 703.3 | 1106.7 | 783.8 | 1217.2 | 1386.8 | 927.2 |
| | පොලී ගෙවීම් | 120.1 | 131.4 | 150.9 | 75.7 | 176.4 | 144.0 |
| | වාරික ගෙවීම් | 284.1 | 285.0 | 395.7 | 172.8 | 422.8 | 460.8 |
| | ශුද්ධ ප්‍රවාහය | 299.1 | 690.3 | 237.2 | 968.7 | 787.6 | 322.4 |

* සටහන - වාණිජ ණය ඇතුලත් වේ.

ශුද්ධ ප්‍රවාහය = වැයයෝජනය - (පොලී ගෙවීම් + වාරික ගෙවීම්)

## 1.4 විදේශ ආධාර උපයෝජනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා ගනුලැබූ නව ක්‍රියාමාර්ග

2007 වසරේ මුල් මාස 09 හි විදේශ ආධාර උපයෝජන ප්‍රමාණය 2006 වසරේ මුල් මාස 09 සහ 2006 සම්පූර්ණ වසර සමඟ සංසන්දනාත්මකව වගුව 10 හි ඉදිරිපත් කර ඇත. විදේශ ආධාර උපයෝජන අනුපාතය පිළිබඳව සැලකිමේදී විදේශ ආධාර වල ස්වභාවය හා සංවර්ධනය පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත් වේ. සමහර විශාල ව්‍යාපෘති සඳහා ඉතාමත් විශාල මූලික ණය ආධාර එකඟවීම් සිදු උවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ චක්‍රයට අනුව එම මුදල දිගුකාලීනව වැය කිරීමට සිදුවිය හැකිය. ඒ අතරම සමහර ව්‍යාපෘති සඳහා ලැබෙන වැඩසටහන් ණය එක් වාරිකයකින් හෝ දෙකකින් සැලකිය යුතු විශාල මුදල් ප්‍රමාණයක් වැයයෝජනය කළ හැකි වේ.

**වගුව 10 - විදේශ ආධාර උපයෝජන අනුපාතය**

| ප්‍රදායකයා | වැයයෝජන අනුපාතය (%) | | |
|---|---|---|---|
| | 2007 | 2006 | 2006 |
| | පළමු මාස 09 | පළමු මාස 09 | මාස 12 |
| ජපානය | 11.81 | 13.51 | 20.47 |
| ආසියානු සංවර්ධන බැංකුව | 8.59 | 12.42 | 19.12 |
| ලෝක බැංකුව | 22.52 | 18.17 | 26.82 |
| චීනය | 27.89 | 2.55 | 2.62 |
| ජර්මනිය | 30.29 | 35.47 | 48.92 |
| වෙනත් | 15.14 | 23.55 | 31.79 |
| **සම්මත අනුපාතය** | 15.4 | 16.02 | 23.47 |

එකඟ වූ විදේශ ආධාර ප්‍රයෝජනයට ගැනීමේදී නොයෙකුත් හේතූන් මගින් බාධක පැමිණ ඇත. වර්ෂය තුළ පළ කරන ලද නව එකඟතා ප්‍රමාණය, ටෙන්ඩර් මණ්ඩල වල කල්ගත වීම්, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රශ්ණ, ව්‍යාපෘති කළමනාකරණ අංශයන්හි නිලධාරි හැකියාවේ ඇති අඩුපාඩු, අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම හා කලට වේලාවට ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම, භාණ්ඩාගාරයෙන් ව්‍යාපෘති වලට අවශ්‍ය මුදල් මුදා හැරීමේදී ඇතිවන ගැටළු, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටියන්හි ඇති ව්‍යාකූලතාවය, ප්‍රදායක ආයතන වල දැඩිබව, නිලධාරිවාදය, හා වෙනස්වූ තත්ත්වයන් මත ව්‍යාපෘති වල අදාළ බව වෙනස්වීම්, යහපාලනයේ ඇති දුර්වලතා මුදා නොගත් දිස්ත්‍රික්ක වල ව්‍යාපෘතියන්

ක්‍රියාත්මක කිරීමේදී ආරකෂක හේතු මත පැන නගින ගැටළු මින් ප්‍රධාන වේ.

විදේශ ආධාර වැයයෝජනය වැඩිකර ගැනීම සඳහා රජය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ගයන් අතර පහත සඳහන් ඒවා කැපී පෙනේ.

- විවිධ මට්ටම් වලදී ව්‍යාපෘති වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම ශක්තිමත්ව හා කාලීනව සිදුකිරීමට කටයුතු යෙදීම. ප්‍රධාන ව්‍යාපෘති වල ප්‍රගති සමාලෝචනය ඉහළම මට්ටමේ සහභාගිත්වයක් සහිතව සිදුකිරීම.

- ප්‍රතිපූර්ණය කලහැකි විදේශාධාර භාවිතා කිරීමේ ක්‍රියා පරිපාටිය වේගවත් කිරීම.

- සම්මත ටෙන්ඩර් ලිපි ලේඛන හඳුන්වාදීම සහ මිලදී ගැනීමේ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම තුලින් මිලදී ගැනීමේ ක්‍රමවත් කිරීම.

- ව්‍යාපෘති සැලසුම් කරන අවස්ථාවේදීම නියමිත ටෙන්ඩර් ලිපි ලේඛන පිළියෙල කිරීම.

- විදේශාධාර ගිවිසුම් වලට එළඹීමට පෙරාතුවම ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල ඒ සඳහා අවශ්‍ය මූලික නිලධාරීන්ද සමඟව ස්ථාපිත කිරීමට කටයුතු කිරීම වැනි මූලික කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු යෙදීම.

- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති වල යෝග්‍යතාවය වර්තමාන තත්වයන්ට අනුව නැවත සමාලෝචනය කර ඒවායේ යෝග්‍යතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් යෙදීම.

- ව්‍යාපෘති කාලය අඩු ව්‍යාපෘති සඳහා විදේශාධාර යෙදවීමට කටය අඩු ප්‍රගතියක් දක්වා ඇති ව්‍යාපෘති කාර්යයන් සඳහා අරමුදල් ඉහළ ප්‍රගතියක් ඇති ව්‍යාපෘති කාර්යයන් වෙත මාරු කිරීම.